දිවි/සං/දෙ/15/07
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව,
4 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

2014.03.24

දිස්ත්‍රික් ලේකම්,
සමෘද්ධි සහකාර කොමසාරිස්,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී,
සියලුම කළමණාකරුවන් සහ සංවර්ධන නිළධාරින් වෙත.

## සිංහල/ හින්දු අලුත් අවුරුදු උළෙලට සමගාමීව දිවිනැගුම අවුරුදු පොල පැවැත්වීම - 2014

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2014.03.21 පැවති රැස්වීමේදි ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා දුන් උපදෙස් පරිදි මෙම වසරේ දි ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දිවිනැගුම අවුරුදු පොළ පැවැත්වීමට කටයුතු කළ යුතුය.

මෙම අලෙවි පොළවල් පැවැත්වීම තුලින්

01. දිවිනැගුම වැඩසටහනට සම්බන්ධ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදනය සඳහා වෙළඳපලක් ලබාදීම.

02. සිංහල හින්දු අවුරුදු සමයට අවශ්‍ය භාණ්ඩ පාරිභෝගිකයින්ට සහන මිලට ලබාදීම මෙන්ම නිෂ්පාදකයාට සාධාරණ මිලක් ඇති කිරිම.

03. දිවිනැගුම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

04. වෙනත් සමාන්තර ආයතන හා නිෂ්පාදකයින් සමග සම්බන්ධතා ප්‍රාදේශීය මට්ටමින් සහ අන්තර් දිස්ත්‍රික් මට්ටමින් ගොඩනගා මෙම වෙළඳ පොළ සාර්ථක කර ගැනීම (ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, සමුපකාර අමාත්‍යාංශය, මහවැලි අධිකාරිය, පළාත් පාලන අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, ලක් සතොස, හදබිම අධිකාරිය, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පශු සම්පත් මණ්ඩලය, ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය, පොල් සංවර්ධන මණ්ඩලය සහ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට සම්බන්ධ අනෙකුත් ආයතන )

2014 අප්‍රේල් මස 05 සිට 12 දින දක්වා පැවැත්වීමට යෝජිත මෙම වැඩසටහන අදාල කාලය තුලදි අවම වශයෙන් දින දෙකක්වත් වන සේ ගැලපෙන පරිදි සංවිධානය කර ගතහැකි වේ.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඍජු මැදිහත්වීම තුල සංවිධානය කරනු ලබන අලෙවි පොලවල් හි දී පහත සඳහන් පරිදි අදාල කටයුතු සංවිධානය කර ගැනීම උචිත වේ.

01. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙවැනි වෙළඳ පලක් පැවැත්වීමට සුදුසුම ස්ථානයක් ප්‍රදේශීය සංවර්ධන කමිටු සභාපති, ප්‍රදේශීය ලේකම්ගේ උපදෙස් හා අදාල ප්‍රදේශීය සභා සභාපති, නගරාධිපති එකගතාවය මත කළමණාකාර අධ්‍යක්ෂ/ මුලස්ථාන කළමණාකරු විසින් තිරණය කල යුතුය.

02. ඉහත පරිදි සුදුසු ස්ථානයක් තෝරාගැනීමේ දි ප්‍රදේශීය සභාව / නගර සභාව වැනි පළාත් ආයතන ප්‍රධානින්ගේ සහාය ලබාගැනිමට කටයුතු කිරිමත්, වෙළඳ පොලවල් පැවැත්වීමේ දිළුම කාර්යය සාර්ථක කරගැනිමට අවශ්‍යා සහය මෙම ආයතන වලින් ලබාගැනීම කල යුතුවේ.

03. දිවිනැගුම වැඩසටහනෙන් විවිධ සහය ලබාගෙන විවිධ නිෂ්පාදන හා සේවාවන් වල නියැලි විශාල ව්‍යාවසායකයින් සංඛ්‍යාවක් ප්‍රාදේශියව විසිරි සිටින බැවින් මෙම වෙළඳ පලවල් පැවැත්වීමේ දී ඔවුනට විශේෂ ප්‍රමුඛත්වයක් ලබාදීම කල යුතුවේ. ඒ අනුව අදාල කාලසීමාව තුල අලෙවි කිරිම සඳහා භාණ්ඩ සකසා ගැනිමට දැනුම්දිමත් අලෙවිකරුවන්ගේ සහභාගිත්වය තහවුරු කර ගැනිමත් කළමණාකරුවන් සහ මහ සංගම් කළමණාකරුගේ වගකීමවේ. වෙළඳ පල තුල සාර්ථකත්වය පවතින්නේ, භාණ්ඩ සුලභ වීම සහ මිල ගණන් සාධාරණ වීම මත බැවින් මේ පිළිබඳව විශේෂ සැලැකිල්ලක් දැක්විය යුතුය.

04. මෙම විශේෂ අවුරුදු පොලවල් වල අලෙවි කිරිම පිණිස විශේෂයෙන් අවුරුදු කාල වල පාරිභෝගිකයා වැඩි පාරිභෝජනයක් සිදුකරණු ලබන භාණ්ඩ ඉදිරිපත් කල යුතුවේ. උදාහරණ ලෙස රෙදි පිළි පාවහන්, කැවිලි වර්ග මුළුතැන්ගෙයි උපකරණ ආහාර ද්‍රව්‍ය පෙන්වාදිය හැක.

05. ඉහත ව්‍යාවසායකයින්ට අමතරව, ලක් සතොස හා සමුපකාර අලෙවි සැලක්ද කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, ගොවිජන සේවා මධ්‍යස්ථානය, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සහය ලබාගනිමින් ඒ ඒ ආයතන වලින් සපයනු ලබන භාණ්ඩ හා සේවාවන් ද සාධාරණ මිලකට ලබාගැනීමට මෙම වැඩපිළිවෙල තුල අවස්ථාව සලසාදිය යුතු වේ. එසේම වෙනත් දිස්ත්‍රික්ක වල සුලභව නිෂ්පාදනය වන භාණ්ඩ මෙම වෙළඳපලට ගෙන්වා ගැනීමට මහ සංගම් හරහා සම්බන්ධීකරණයක් ගොඩනගා ගත යුතුවේ.

06. මහ සංගම් ( දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති ) සහ බැංකු සංගම් (දිවිනැගුම ප්‍රජා මූල බැංකු ) ප්‍රවර්ධන වැඩසටහන් ද මේ සමග ක්‍රියාත්මක කල යුතු බැවින් රු. 100,000/= කට උපරිමයකට යටත්ව මේ සඳහා වියදම් කළ හැක. බැංකු මගින් වියදම් වන මුදල් බැංකු ප්‍රවර්ධන කටයුතු යටතේ ද ( කේත අංක 2134) මහ සංගම් මගින් වැය වන මුදල් "වැය ගිණුම බැංකු සහ මහ සංගම් ප්‍රවර්ධන කටයුතු " ( කේත අංක 6209) යටතේ දැරිය යුතුය.

07. බැංකු සහ මහ සංගම් මේ සඳහා වැය කරන මුදල නැවත උපයා ගැනීමේ වැඩපිළිවෙලක්ද යෙදිය යුතුය. ඒ අනුව පොළට සහභාගිවන අයගෙන් ප්‍රාදේශිය වශයෙන් තීන්දු කරන යම් සාධාරණ මුදලක් අයකර ගත හැක. මෙම නැවත අයවන මුදල් සමෘද්ධි මහ සංගමයේ "අලෙවි පොළ සංවර්ධන චක්‍රිය අරමුදල් ගිණුම" (කේත අංක 9408) යටතේ බැරකල යුතුය. මෙම අරමුදල චක්‍රිය අරමුදලක් ලෙස වර්ධනය කල යුතු අතර මෙවැනි සමාන කටයුතු සඳහා මෙම මුදල් වැයකල හැකිවේ. කෙසේ නමුත් බැංකු මූල්‍යා / මහ සංගම් අංශයේ පූර්ව අනුමැතිය ඒ සඳහා ලබාගත යුතුය. මෙම කටයුතු සඳහා අනුග්‍රාහකයන්ගේ සහයද ලබාගත හැක.

08. දිවිනැගුම වැඩසටහන, දිවිනැගුම ප්‍රජා මූල බැංකු වැඩසටහන පූජාව තුල ප්‍රචලිත කිරිමට මෙම වැඩපිළිවෙල මාධ්‍යක් බැවින් අදාල වෙළඳපල විචිත්‍ර ලෙස සංවිධානය කල හැකිය. අපගේ සමාජ සංවර්ධන අංශය යටතේ කැකුළු ළමා සමාජ නාට්‍ය හා සංගිත වැනි කටයුතු සංවිධානය කල හැක. තවද සංස්කෘතික අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව යටතේ ඇති අංශ වල සහායද ලබාගැනිම උචිත වේ.

09. මෙම පොළ පැවැත්වීමට අදාල සියලු ගනුදෙනු සටහන් කර මහ සංගමයේ සුරක්ෂිතව තැබිය යුතු අතර ඉදිරි විගණන කටයුතු වලදී මෙම තොරතුරු භාවිතා කරනු ඇත.

10. මෙම ප්‍රදර්ශනය සංවිධානය කිරිමේ වගකීම දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශිය ලේකම් උපදෙස් මත සියලුම කළමණාකරුවන් සහ සංවර්ධන නිළධාරින් දැරිය යුතු වේ. දිස්ත්‍රික් ලේකම්ගේ උපදෙස් මත සමෘද්ධි සහකාර කොමසාරිස්, දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිළධාරින්, ජිවනෝපාය විෂය භාර සහ බැංකු මහ සංගම් කටයුතු භාර දිස්ත්‍රික් කළමණාකරුවන් දිස්ත්‍රික්කය තුල මෙම වැඩසටහන සාර්ථක කර ගැනිමට අවශ්‍ය මගපෙන්විම හා සහයෝගය ලබාදිය යුතුය. **ඇමුණුම 01 සදහන් තොරතුරු 2014.03.31 දිනට පෙර ද පොළ පැවැත්විමෙන් අනතුරුව ඇමුණුමේ 02 සදහන් තොරතුරු අලෙවි අංශය වෙත ( jeevonopaya@gmail.com ) කඩිනමින් යොමු කල යුතුය.**

ප්‍රදේශයේ ප්‍රභූවරුන්, ආගමික නායකයින්, මහජන නියෝජිතයින් ද මෙම අලෙවි පොළ කටයුතු සඳහා අරාධනා කලයුතු අතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුල මෙම අලෙවි පොල සංවිධානය කිරිමට සියලු දෙනා එක්ව කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනිමට ඔබ දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

ආර්. පී. බී. තිලකසිරි

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත්

1. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා කා.දැ.ගැ.පි.
2. ආර්ථික සංවර්ධන නියෝජය අමාත්‍ය ගරු එස්. එම්. චන්ද්‍රසේන මැතිතුමා කා.දැ.ගැ.පි.
3. ආර්ථික සංවර්ධන නියෝජය අමාත්‍ය ගරු මුත්තුසිවලිංගම් මැතිතුමා කා.දැ.ගැ.පි.
4. ආර්ථික සංවර්ධන නියෝජය අමාත්‍ය ගරු සුසන්ත පුංචිනිලමෙ මැතිතුමා කා.දැ.ගැ.පි.
5. ආර්ථික සංවර්ධන නියෝජය අමාත්‍ය ගරු එම්.එල්.ඒ.එම්.හිස්බුල්ලා මැතිතුමා කා.දැ.ගැ.පි.
6. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය කා.දැ.ගැ.පි.
7. සභාපති ලක් සතොස ආයතනය කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
8. ප්‍රධාන ගණකාධිකාරි - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව අ.ක.ස
9. නියෝජ්‍ය ප්‍රධාන අභ්‍යන්තර විගණක දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව අ.ක.ස